ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I,II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2012 ජූලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2012
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2012

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
I, II
Business and Accounting Studies I, II

10 ශ්‍රේණිය
Grade 10

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

- ❖ පළමුවන ප්‍රශ්නය ඇතුලුව සියලු ම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

---

01. සමනලි තම නිවස තුළ තමාට හා පවුලේ අයට අවශ්‍ය වන ඇඳුම් මැසීම සිදුකරනු ලබයි. ඇයගේ හැකියාව දුටු බොහෝ දෙනාගේ අදහස වූයේ තමන්ගේ ම ව්‍යාපාරයක් ලෙස මෙය දියුණු කල යුතු බවයි. මේ අනුව ඇය විසින් තම නිවසේ ම, තම ව්‍යාපාරය දියුණු කරන ලදි.

පසුකාලීනව ඇගළුම් සඳහා වූ ඉල්ලුමක් සමග ඇය විසින් තම ව්‍යාපාරය දියුණු කිරීමේ අරමුණින් නාමලීව ද තම ව්‍යාපාරයට සම්බන්ධ කර ගන්නා ලදි. නාමලී කලක් නගරයේ ඇගළුම්හලක සේවය කර ඇති ඇගළුම් නිර්මාණය සම්බන්ධ පාඨමාලාවක් ද හදාරා ඇත. ඔවුන් විසින් මෙම ව්‍යාපාරය සඳහා, "ලස්සන සඟපිලි" ලෙස නම යොදා ගැනීමට තීරණය කොට ඇත.

ව්‍යාපාරයේ ආරම්භයේ වත්කම් හා වගකීම් පහත දැක්වේ. வணிகக் கல்வியும் கணக்கீடும்

| | | | |
|---|---|---|---|
| මහන මැෂින් | 100,000 | මුදල් | 25,000 |
| ණයහිමියෝ | 20,000 | ගොඩනැගිලි | 250,000 |
| බැංකු | 70,000 | ණයගැතියෝ | 35,000 |

ව්‍යාපාරයේ පළමු වර්ෂයේ සිදුවූ ගනුදෙනු වල සාරාංශයක් පහත වේ.

| | | | |
|---|---|---|---|
| අත්පිට විකුණුම් | 127,000 | ණයට විකුණුම් | 33,000 |
| ගැණුම් | 85,000 | විදුලිය | 5,000 |
| දුරකථන | 3,500 | වෙනත් වියදම් | 4,250 |

1. මෙහිදි දක්නට ලැබෙන නිෂ්පාදනය වර්ග කර දක්වන්න.
2. මෙම ව්‍යාපාරය නාමලී සමග නැවත ආරම්භ කිරීමට අදහස් කරයි නම් ඒ සඳහා සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
3. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුද? එසේ නම් ඒ ඇයි ?
4. නව ව්‍යාපාර සංවිධාන ක්‍රමයෙහි කේවල ස්වාමි ව්‍යාපාරයකට සාපේක්ෂව ඇති වාසි හා අවාසි 2 බැගින් ලියන්න.
5. මෙම ව්‍යාපාරය ආරම්භයට මොවුන්ට ඇති ශක්තීන් මොනවා ද?
6. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළහොත් එයින් ලැබෙන වාසි මොනවාද?
7. ඉහත ව්‍යාපාරය වැඩි දියුණුකිරීමට මූල්‍ය සම්පාදනය කර ගත හැකි ආකාර මොනවාද?
8. ඉහත ව්‍යාපාරය සඳහා ව්‍යාපාර සැලැස්මක් සකස් කිරීමට මොවුන් අදහස් කරයි නම් එහි අන්තර්ගතය කුමක්ද?
9. සැලැස්මක් සකස් කිරීමෙන් ව්‍යාපාරයට ලැබෙන ප්‍රතිලාභ මොනවාද?
10. මෙම ව්‍යාපාරයට බලපාන ප්‍රධාන බාහිර පරිසර සාධක 2 ක මොනවා ද?

(ලකුණු 02 x 10 = 20 යි)

හයවන පිටුව බලන්න

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

## (ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.)

02. (i) වර්තමාන ව්‍යාපාර බොහෝ දුරට සමාජ සුභසාධනය කෙරේ යොමු වෙමින් පවතී. එයට හේතු මොනවා ද?

(ii) ශ්‍රම විභජනයේ ඇති අවාසි දෙකක් ලියන්න.

(iii) පහත සඳහන් සාධක සඳහා අයත් ව්‍යාපාර පරිසරය නම් කරන්න.

- ❖ උද්ධමනය, පොලි මට්ටම, වැටුප්
- ❖ වයස් ව්‍යුහය, ජන සංඛ්‍යාව, ස්ත්‍රී පුරුෂ භාවය
- ❖ ඇඳුම්, සිරිත්විරිත්, විවිධ ආගම්
- ❖ නව නිෂ්පාදන, විද්‍යාත්මක ක්‍රම, සොයා ගැනීම්

(iv) සීමිත පෞද්ගලික සමාගමක් හා පොදු සමාගමක් අතර ඇති වෙනස්කම් 2ක් ලියන්න.

(v) සමුපකාර ව්‍යාපාරය ආරම්භ කිරීමට ප්‍රධාන හේතුව කුමක් ද?

(ලකුණු 02 x 05 = 10 යි)

03. (i) වාණිජ බැංකුවක් යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් රේඛණ වල අරමුණ කුමක්දැයි පැහැදලි කරන්න.

(අ)




(ආ)




(ලකුණු 02 යි)

(iii) ආදායකයාට චෙක්පත ලැබුණු පසු එය මුදල් ගර ගත හැකි අවස්ථා 2ක් ලියන්න.

(ලකුණු 02 යි)

(iv) නාරද වත්තේවැව කොටිකාවත්ත මහජන බැංකුවේ අංක 108 00 3622 7 දරණ ජංගම ගිණුම් හිමිකරු වේ. 2012 ජුලි මස 03 වන දින වත්තල කොමර්ෂල් බැංකුවේ ජංගම ගිණුම් හිමියකු වන තනුජා කොස්ලන්ද රු. 18,631.50 වටිනා බඩු තොගයක් මිලට ගෙන ඒ සඳහා අංක 624452 දරන චෙක්පත නිකුත් කරන ලදී. ඉහත දත්ත ආධාරයෙන් චෙක්පතක දළ ආකෘතියක ඇඳ පෙන්වන්න.

(ලකුණු 04 යි)

04. නිෂ්පාදන ආයතනයක 2011.12.31 දිනට උපුටා ගන්නා ලද ශේෂයන් පහත දැක්වේ.

| | |
|---|---|
| ඉන්ධන හා බලය | 8,200 |
| නිෂ්පාදන වැටුප් - සෘජු | 1,700 |
| කම්හල් විදුලිය | 1,100 |
| කම්හල් වැටුප් | 1,400 |
| 2011.01.01 තොගය | 2,300 |
| අමුද්‍රව්‍ය ගැණුම් | 3,100 |
| යන්ත්‍ර ක්ෂය | 1,000 |
| 2011.12.31 තොගය | 1,400 |
| නිෂ්පාදන ඒකක ගණන | 1000 |
| ලාභාන්තිකය පිරිවැයෙන් | 20% |

මෙහෙයුම් සැලැස්මක් සකස් කොට මේවා සොයන්න.

1. මුලු සෘජු පිරිවැය
2. ඒකකයක පිරිවැය
3. ඒකකයක ලාභය
4. ඒකකයක විකුණුම් මිල

(ලකුණු 10 යි)

05. පහත දැක්20වන්නේ එක්තරා ව්‍යාපාරයක 2011.12.31 දිනට තොරතුරු කිහිපයකි. ඒ ඇසුරෙන් මුල්‍ය සැලැස්මක් සකස් කර කාරක ප්‍රාග්ධනය සොයන්න.

| | |
|---|---|
| ගොඩනැගිලි | 200,000 |
| ප්‍රාග්ධනය | 337,500 |
| බැංකු ණය | 140,000 |
| යන්ත්‍ර සූත්‍ර | 150,000 |
| බඩු තොගය | 30,000 |
| ණය ගැතියෝ | 16,000 |
| ණය හිමියෝ | 18,000 |
| ලී බඩු | 80,000 |
| පරිගණක | 40,000 |
| උකස් ණය | 30,000 |
| ලැබිය යුතු මුදල් | 8,000 |
| උපචිත වියදම් | 7,000 |
| මුදල් ශේෂය | 8,500 |

(ලකුණු 10 යි)

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක

සිසිර කුමාර

විසින් සම්පාදිත යි.